# පීඨාධිපති සම්මාන උළෙල සහ ජාතික පර්යේෂණ සමුළුව - 2022

රජරට විශ්වවිද්‍යාලයීය සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේදී



**මහාචාර්ය සංජීවනී ගිනිගද්දර**

උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය



**මහාචාර්ය තුසිත මැන්ඩිස්**

පීඨාධිපති
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය



**මහාචාර්ය මංජුල රණගලගේ**

සභාපති
පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා**

ප්‍රධාන ආරාධිත

සභාපති, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර ස්ථාවර කමිටුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව මගින් සංවිධානය කරන ප්‍රථම පීඨාධිපති සම්මාන ප්‍රදාන උළෙල හා ජාතික පර්යේෂණ සම්භාෂණය 2022, නොවැම්බර් 29 වෙනි දින පෙ.ව. 9.00 සිට ප.ව. 8.00 දක්වා උත්කර්ෂවත් අයුරින් පීඨ පරිශ්‍රයේදී හා මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ පැවැත්වේ.

උපකුලපති, මහාචාර්ය සංජීවනී ගිනිගද්දර මහත්මියගේ සහභාගීත්වයෙන්, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති මහාචාර්ය තුසිත මැන්දිස් මහතාගේ මගපෙන්වීම හා උපදේශකත්වය යටතේ පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ සභාපති මහාචාර්ය මංජුල රණගලගේ මහතා ප්‍රමුඛ කමිටු සාමාජිකත්වයේ සංවිධානාත්මක මෙහෙයවීමෙන් පැවැත්වෙන මෙම සම්භාෂණයේ ප්‍රධාන ආරාධිතයා මෙන්ම, ''ජාතික සංවර්ධනය සඳහා බහුවිෂයීය පර්යේෂණ ප්‍රවර්ධනයේ වැදගත්කම'' යන මැයෙන් ආමුඛ දේශනය පවත්වනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර ස්ථාවර කමිටුවේ සභාපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා විසිනි. පුරාවිද්‍යා හා උරුම කළමනාකරණය, පරිසර කළමනාකරණය, මානවශාස්ත්‍ර, සමාජීයවිද්‍යා, ආර්ථිකවිද්‍යා, භාෂා හා තොරතුරු තාක්ෂණ, යන අධ්‍යයනාංශ ප්‍රධානීන්ගේ හා අධ්‍යයන, අනධ්‍යයන කාර්යමණ්ඩලවල සහයෝගයෙන් හා සහභාගීත්වයෙන් මෙහි කටයුතු ක්‍රියාත්මක කෙරේ.

පීඨාධිපති සම්මාන ප්‍රදානය මගින් පීඨයේ පර්යේෂණ ක්‍රියාවලිය සාර්ථකත්වයට පත්කරගැනීමට අපේක්ෂිතය. නව ලෝකයට උචිත වන පරිදි පර්යේෂකයින් දිරි ගැන්වීම සඳහා සිදුකරනු ලබන සම්මාන ප්‍රදානයේදී විශිෂ්ටතම ජ්‍යෙෂ්ඨ හා තරුණ පර්යේෂකයා, හොඳම එච්. ඉන්ඩෙක්ස් හා සයිටේෂන්ස් පර්යේෂණ ප්‍රකාශකයා, ඉන්ඩෙක්ස් හා විමර්ශිත ශාස්ත්‍රීය පර්යේෂකයා, හොඳම පර්යේෂණ ග්‍රන්ථ හා ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශකයා, හොඳම නිර්මාණාත්මක ප්‍රකාශකයා, වැඩිම සයිටේෂන්ස් පළකිරීම් සහිත දෙපාර්තමේන්තුව, පර්යේෂණ දායකත්වය සැපයූ හොඳම දෙපාර්තමේන්තුව, මෙන්ම ජීවිත කාලයේදී එක් වරක් පමණක් ලැබෙන විශිෂ්ටතම පර්යේෂකයාට හිමි රන් සම්මානය යනුවෙන් ක්ෂේත්‍ර නවයක් ඔස්සේ සම්මාන, ත්‍යාග හා සහතික ප්‍රදානය සිදු කෙරේ.

"ජාතික සංවර්ධනය සඳහා බහුවිෂයීය පර්යේෂණ ප්‍රවර්ධනය"

යන තේමාව ඔස්සේ ජාතික පර්යේෂණ සම්භාෂණය පැවැත්වේ. ඒ සඳහා ලංකාවේ විවිධ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනය නියෝජනය වන පරිදි පර්යේෂණ පත්‍රිකා හැත්තෑවක් (70) පමණ, භෞතිකව හා මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීමට පුරාවිද්‍යාව, උරුම කළමනාකරණය හා ඉතිහාසය, පරිසර කළමනාකරණය, භූගෝල විද්‍යාව හා සංවර්ධන අධ්‍යයනය, භාෂාව, සංස්කෘතිය හා සාහිත්‍යය, තාක්ෂණ නවෝත්පාදනය හා අධ්‍යාපනය, ආර්ථිකය, ආණ්ඩුකරණය හා පාසල්, සන්නිවේදනය හා ජනමාධ්‍ය, සමාජ විද්‍යාව හා මානව විද්‍යාව, සංචාරක ව්‍යාපාරය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම සියලු ශාස්ත්‍රීය කටයුතු මගින් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ලාංකේය පර්යේෂණ ක්ෂේත්‍රයේ මෙන්ම නව දැනුම් නිෂ්පාදනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

මාධ්‍ය කමිටුව